# ජාතික සමුපකාර ප්‍රතිපත්තිය

## 1. පූර්විකාව

- ❖ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නව වැනි උප ලේඛනයේ (වගන්ති 154/ඒ) (පළාත් සභා ලැයිස්තුවේ) සමුපකාරය පිළිබඳව ඡේද අංක 17 පිළිබඳ අවධානය යොමු කරමින් ද ;
- ❖ විසිවන සියවස ආරම්භයේ සිට රටේ ආර්ථික හා සමාජ සංවර්ධනයේ දී සමුපකාර ව්‍යාපාරය ඉටු කරන ලද කාර්යභාරය හා එහි වැදගත් කම පිළිගනිමින්ද ;
- ❖ වර්ෂ 2000 දී සමුපකාර ව්‍යාපාරය පිළිබඳව පත් කරන ලද ජනාධිපති කොමිෂන් සභාව විසින් කරන ලද පූර්ණ අධ්‍යයනයේ නිර්දේශ වලට අවධානය යොමු කරමින් ද ;
- ❖ ශ්‍රී ලංකා ජනරජයේ අනෙකුත් අංශ වල ප්‍රකාශිත ප්‍රතිපත්ති කෙරෙහි අවධානය යොමු කරමින් ද ;
- ❖ 1995 පැවති ජාත්‍යන්තර සමුපකාර සංධානයේ මහ සම්මේලනයේ දී සම්මත වූ සමුපකාර අනන්‍යතාව පිළිබඳ ප්‍රකාශයට අවධානය යොමු කරමින් ද;
- ❖ සමුපකාර සංවර්ධනය සඳහා සහාය වාතාවරණයක් නිර්මාණය කිරීම පිළිබඳව එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් 2001 වර්ෂයේදී ප්‍රකාශිත මගපෙන්වීම් සඳහා අවධානය යොමු කරමින් ද ;
- ❖ සමුපකාර ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම පිළිබඳව ජාත්‍යන්තර කම්කරු සංවිධානය විසින් 2001 දී ප්‍රකාශිත 193 වැනි නිර්දේශය කෙරෙහි අවධානය යොමු කරමින් ද ;
- ❖ ජාත්‍යන්තර සමුපකාර සංවිධානය විසින් 2012 වර්ෂයේදී මහ සභා සම්මුතියෙන් ප්‍රකාශිත සමුපකාර සංවර්ධන දශකයක් (2011-2020) සඳහා වූ යෝජනා පත්‍රයට අවධානය යොමු කරමින් ද ;
- ❖ එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ඉදිරිපත් කර ඇති 2012 සිට ඉදිරියට සමුපකාර ව්‍යාපාරය සඳහා වූ ජාත්‍යන්තර ක්‍රියාකාරි සැලැස්ම පිළිබඳ යෝජනාවට අවධානය යොමු කරමින් ද ;
- ❖ එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් සම්මත කරන ලදුව ශ්‍රී ලංකාව විසින් ආදේශනය කරගන්නා ලද ධරණීය සංවර්ධන ඉලක්ක ප්‍රකාශයට අවධානය යොමු කරමින් ද ;
- ❖ සමුපකාර ව්‍යාපාරය හා පළාත් සභා සමඟ සහභාගීත්ව ක්‍රමවේදය මඟින් ප්‍රතිපත්තිය පිළිබඳ අත්හදා බැලීම් වල ප්‍රතිඵල සලකා බලමින්ද ;
- ❖ ලෝකයේ වෙනත් රටවල සමුපකාර ව්‍යාපාරයේ සංවර්ධනය හා ප්‍රවණතාවයන්ද සැලකිල්ලට ගනිමින්ද ;
- ❖ සමුපකාර අංශය සඳහා වූ 2020 මාර්ග සැලැස්ම යන තේමාවෙන් 2017 අගෝස්තු 25 දින සණස මණ්ඩපයේදී පවත්වන ලද වැඩමුළුවේ අන්තර්ගතය සලකා බලමින්ද ;
- ❖ ශ්‍රී ලංකා ජනරජය විසින් ප්‍රකාශිත "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනය සලකා බලමින්ද;

මෙම ලේඛනයේ අන්තර්ගතය, “සෞභාග්‍යමත් දේශයක් - ශක්තිමත් සමුපකාරයක්” බිහි කිරීමේ ජාතික සමුපකාර ප්‍රතිපත්තිය වශයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් පිළිගනු ලැබේ.

## 2. හේතු යුක්ති

2.1. එක්දහස් නවසිය හැත්තෑ ගණන් වල ක්‍රියාත්මක කරන ලද අර්ථ ක්‍රමය ප්‍රතිව්‍යුහගත කිරීම් හා නිදහස් වෙළඳපළ ප්‍රතිපත්ති හේතු කොටගෙන තමන් අනුගමනය කරන ව්‍යාපාරික උපායමාර්ග සම්බන්ධයෙන් නැවත සිතා බැලීමට සමුපකාර සංවිධාන පෙළඹුනි; එනමුදු 1972 දී හඳුන්වා දෙන ලද නීතියේ ප්‍රතිපාදන භාණ්ඩ බෙදා හැරීමට සීමා වූ මධ්‍යගත පාලනයෙන් යුතු ආර්ථිකයක් නිර්මාණය කිරීමට සකස් කරන ලද්දක් මිස අලුතින් ඇති වූ වෙනස්කම් වලට ප්‍රතිචාර දැක්වීමට යෝග්‍ය වූයේ නැත.

2.2. රටේ දුෂ්කර කාලපරිච්ඡේද වලදී සමුපකාර සංවිධාන ආර්ථික හා සමාජ සංවර්ධනයෙහිලා වැදගත් කාර්යය භාරයක් ඉටු කරන ලද අතර දුප්පතුන්ට සහන සැලසීමේ රජයේ වැඩපිළිවෙල තුළින් ඇතැම් බිම් මට්ටමේ සමුපකාර සංවිධාන යළි නැගිටීමේ ක්‍රියාවලියක තවමත් නිරත වී සිටිති.

2.3. රාජ්‍ය හා පෞද්ගලික අංශ සමඟ විටෙක තරඟ කරමින් ද තවත් විටෙක සහයෝගයෙන් නැතහොත් හවුල් කරුවන් ලෙස කටයුතු කරමින් ද රටේ සමාජ ආර්ථික සංවර්ධනයේ දී පුද්ගලික අංශයේම සුවිශේෂ වූ කොටසක් ලෙස ව්‍යාපාර කටයුතු කරගෙන යන බිම් මට්ටමේ සිට මුදුන් මට්ටම සහ ජාත්‍යන්තර මට්ටම දක්වා වූ සමුපකාර ජාලය තුළ සහ ඉන් පිටත සාධාරණව කටයුතු කිරීමේ පරිසරයක් නිර්මාණය කළ යුතුව තිබේ.

2.4. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය යටතේ සමුපකාර විෂය පළාත් විෂයයක් ලෙස විමධ්‍යගත කළ විට රජය හා පළාත් සභා අතර ඒ පිළිබඳව ස්ථාපිත කළ යුතු හා පවත්වා ගත යුතු සම්බන්ධතා කෙබඳුද යන්න හඳුනාගැනීමේ අවශ්‍යතාව පැවතුනි. මෙම හඳුනා ගැනීම තුළ සමුපකාර ව්‍යාපාරයේ ජාතික කාර්ය භාරය නැවත විග්‍රහ වන බැවින් සමුපකාර ව්‍යාපාරය සඳහා ජාතික ප්‍රතිපත්තියක අවශ්‍යතාවය හඳුනා ගැනේ.

2.5. ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක හා නිදහස් වෙළඳපල ආර්ථිකය පිළිගනිමින් ආර්ථික හා සමාජ සංවර්ධනය සඳහා නිරතුරුවම සමුපකාරය සංවර්ධනය කිරීම ප්‍රමුඛ කොට සළකන අතර සියලු තලයන්හි සිරස් හා තිරස් සම්බන්ධිකරණය සඳහා පහසුකම් සලස්වමින්ද සේව්‍යයන්ගේ හා සේවකයන්ගේ සංවිධාන අතර ක්‍රියාකාරී සම්බන්ධතා සහ ගැලපීම් පවත්වා ගනිමින්ද රජය විසින් හිතකර ප්‍රතිපත්ති හා නියාමනයන් අනුව ක්‍රියා කරනු ඇත. සමුපකාර සංවිධාන රාජ්‍ය හා පෞද්ගලික දෙඅංශයේ අතර මැදි ජාලයක් මෙන්ම එහි අවශ්‍යම කොටසක් ලෙස ස්වයං වගකීමකින් යුතුව ක්‍රියා කළ යුතුය.

2.6. රටතුල ක්‍රියාත්මක වන ප්‍රතිපත්ති හා වැඩ සටහන් 2015 එක්සත් ජාතීන්ගේ ප්‍රකාශයෙන් උකහා ගත් ධරණීය සංවර්ධන ඉලක්ක 2030 වන විට ළඟා කර ගැනීම පිණිස කටයුතු කරයි. එම නිසා වර්තමාන සමුපකාර අංශයේ දුර්වලකම් හඳුනා ගෙන ඒවා වැලැක්වීමට සුදුසු සමුපකාර ප්‍රතිපත්තියක් ප්‍රවර්ධනය කල යුතුය.

2.7. සමාජ වෙළඳපොල ආර්ථිකයක මූලධර්ම පදනම් කරගෙන සකස් කර ඇති සෞභාග්‍යයේ දැක්ම නම් වූ නව ක්‍රියාකාරී වැඩපිළිවෙල තුළින් සමෘද්ධිමත් යුගයක් කරා ශ්‍රී ලංකාවාසීන් තබන තවත් පියවරකි. ගෝලීය ආර්ථිකයේ ඵලදායී භාවය සහ ආර්ථික වර්ධනය සඳහා කුසලතා මත පදනම් වූ තාක්ෂණික වෙනසක් ඇති කිරීම අවශ්‍ය වේ. එම වෙනස ඇති කිරීම සඳහා නිර්මාණාත්මක ගුණය හා ව්‍යවසායකත්වය පෝෂණය කළ යුතුය. වෙනසක් කරා රට යන මෙම ගමනේදී රජයට සහාය වනු පිණිස සමුපකාර අංශයද ශක්තිමත්ව තම කාර්යභාරය ඉටු කළ යුතු වේ.

## 3. ජාතික සමුපකාර ප්‍රතිපත්තියේ අරමුණ

ජාතික සමුපකාර ප්‍රතිපත්තියේ අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධනයට දායක වන අතරම සමුපකාර ව්‍යාපාරය දියුණු, පුළුල් හා සවිමත් කරමින් ස්වීය අයිතිය පිළිබඳ හැඟීමෙන් යුතුව සහභාගී වන සාමාජිකයන්ගේ හා පොදු ජනතාවගේ අවශ්‍යතා සපුරාලීම සඳහා ජාත්‍යන්තර වශයෙන් පිළිගෙන ඇති සමුපකාරික හරයන් හා සමුපකාරික මූලධර්ම මත පදනම්ව දේශපාලන මැදිහත් වීම් වලින් තොරව, හිතකර වූ හා සහායශීලී වූ ජාතික ප්‍රතිපත්තිමය ආකෘතියක් සකස් කර දීමය. ඒ තුළින් සෞභාග්‍යමත් රටක, ශක්තිමත් සමුපකාරයක් ඇති කිරීමට අපේක්ෂා කෙරේ.

## 4. සමුපකාර සාරධර්ම

සම්ප්‍රදායයක් වශයෙන් සමුපකාර සංවිධාන විසින් ආත්මාධාරය, ස්වයං වගකීම, ප්‍රජාතන්ත්‍රවාදය, සමානාත්මතාව, සමතාව හා සහයෝගිතාව යන මූලික සාරධර්ම පදනම් කරගෙන ඇත. මෙම සමුපකාර සාරධර්ම වලට අවංක භාවය, විවෘත භාවය, සමාජමය වගකීම හා අන්‍යයන් පිළිබඳව සැලකිලිමත් වීම යන ආචාර ධර්ම ද ඇතුලත් කරගෙන තිබේ.

## 5. මග පෙන්වන මූලධර්ම

පහත සඳහන් වන්නේ සමුපකාර සංවිධාන තම සාරධර්ම ප්‍රායෝගිකව යොදා ගන්නා ප්‍රතිපත්ති වලින් පිළිබිඹු වන මග පෙන්වීමය. ඒවා ලොව පුරා පිළිගත්, එසේම සමස්ථ සමුපකාර ව්‍යාපාරය විසින් ගරු කරන මූලධර්ම වේ.

සමුපකාර මූලධර්ම මගින් සමුපකාර සාරධර්මයන් ක්‍රියාවට නැංවේ. ලොව පුරා පිළිගත් එම මූලධර්ම අනුව සියළු සමුපකාර සංවිධාන ක්‍රියා කරති.

### 5.1. ස්වේච්ඡා හා විවෘත සාමාජිකත්වය

සමුපකාර සංවිධාන යනු ස්ත්‍රී පුරුෂ, සමාජයීය, වාර්ගික, දේශපාලනික හෝ ආගමික වෙනස් කම් වලින් මුක්ත වූ සාමාජිකත්වයේ වගකීම් භාර ගැනීමට කැමති හා ඒවායේ සේවාවන් යොදා ගැනීමට හැකි සියළු දෙනාටම විවෘත වූ ස්වේච්ඡා සංවිධාන වේ.

### 5.2. ප්‍රජාතන්ත්‍රවාදී සාමාජික පාලනය

සමුපකාර සංවිධාන යනු ඒවායේ සාමාජිකයින් විසින් පාලනය කෙරෙන ප්‍රජාතන්ත්‍රවාදී සංවිධානයන්ය. එහිදී සාමාජිකයෝ තම ප්‍රතිපත්ති ස්ථාපිත කිරීම සඳහාත්, තීරණ ගැනීම සඳහාත් ක්‍රියාකාරී ලෙස සහභාගි වෙති. ඡන්දයෙන් පත්වන නියෝජිතයින් ලෙස ක්‍රියා කරන ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයම සාමාජිකත්වයට වගකීමට බැඳී සිටිති. ප්‍රාථමික සමුපකාර සංවිධාන වල සාමාජිකයින්ට සමාන ඡන්ද අයිතිය තිබේ. අනෙකුත් මට්ටම් වල සිටින සමුපකාර සංවිධානද ප්‍රජාතන්ත්‍රවාදී ලෙස සංවිධානය වේ.

### 5.3. සාමාජිකයන්ගේ ආර්ථික කටයුතු වල සහභාගීත්වය

තම සමුපකාරයට සමසේ ප්‍රාග්ධන දායකත්වයක් උසුලන සාමාජිකයින් විසින් එය ප්‍රජාතන්ත්‍රවාදී ලෙස පාලනය කරනු ලබති. යටත් පිරිසෙයින් එම ප්‍රාග්ධනයෙන් කොටසක් සමුපකාර සංවිධානයේ පොදු වත්කමක් වේ.

සාමාජිකත්වය ලැබීමට කොන්දේසියක් වනසේ දායක වූ ප්‍රාග්ධනයට අනුරූපව සීමිත ප්‍රතිලාභයක් ඔවුහු ලබති. සාමාජිකයෝ පහත දැක්වෙන අරමුණු සියල්ලටම හෝ කිහිපයකට හෝ සමිතියේ ඇති අතිරික්ත වත්කම් වෙන් කරති. ඒවා නම් කිසිදු ආකාරයකින් හෝ බෙදී නොයන පරිදි සංචිත ඇති කිරීමෙන් තම සමුපකාරය දියුණු කිරීම; සමුපකාරය සමඟ කරන ලද ව්‍යාපාරික ගනුදෙනු වලට අනුපාතිකව සාමාජිකයින්ට වාසි ලබා දීම හා සාමාජිකත්වය විසින් අනුමත කරන ලද අනෙකුත් කටයුතු වලට සහාය දීම යන මේවා වේ.

### 5.4.ස්වාධීනත්වය හා ස්වෛරීයත්වය

සමුපකාර සංවිධාන යනු ඒවායේ සාමාජිකයින් විසින් පාලනය කරනු ලබන්නා වූ ස්වාධීන, අන්‍යොන්‍යාධාර සංවිධානයන්ය. ඔවුහු රජය ඇතුළු අන්‍ය සංවිධාන සමග ගිවිසුම් වලට එළඹුණහොත් හෝ බාහිර මාර්ග වලින් ප්‍රාග්ධනය ලබා ගතහොත් තම සාමාජිකයන්ගේ ප්‍රජාතන්ත්‍රවාදී පාලනය සහතික වන අයුරින් හා තම සමුපකාර සංවිධානයේ ස්වාධීනත්වය තහවුරු වන පරිදි සකස් කරන ලද කොන්දේසි මත පමණක් එසේ කරති.

### 5.5.අධ්‍යාපනය, පුහුණුව හා තොරතුරු විකාශනය

තම සාමාජිකයින්ගේ ඡන්දයෙන් පත්වූ නියෝජිතයින්ට හා කළමනාකරුවන්ට ඵලදායි දායකත්වයක් සමුපකාර සංවර්ධනයට ලබා දීම සඳහා අවශ්‍ය අධ්‍යාපනය හා පුහුණුව සමුපකාර සංවිධාන විසින් ලබා දෙනු ලැබේ. එසේම සමුපකාරයෙහි ස්වභාවය හා ලැබෙන වාසි පිළිබඳව පොදු මහජනයා, විශේෂයෙන් තරුණ තරුණියන් හා මහජන මතය ගොඩනගන්නවුන් දැනුවත් කිරීම්ද කරනු ලැබේ.

### 5.6.සමුපකාර අතර සහයෝගය

ප්‍රාදේශික, ජාතික, කලාපීය හා ජාත්‍යන්තර ව්‍යුහයන් එකමුතුව කටයුතු කිරීම මඟින් සමුපකාර සංවිධාන තම සාමාජිකයින්ට ඵලදායි ලෙස සේවය කිරීමට හැකි වන අතර සමුපකාර ව්‍යාපාරයද ශක්තිමත් කෙරේ.

### 5.7.ප්‍රජාව පිළිබඳව සැලකීම.

සමුපකාර සංවිධාන තම සාමාජික අවශ්‍යතා හා අපේක්ෂාවන් පිළිබඳව අවධානය යොමු කරන අතරම තම ප්‍රජාවට තිරසාර සංවර්ධනයක් ලබා දීම සඳහාද කටයුතු කරති.

## 6. ප්‍රතිපත්ති ප්‍රකාශය

### 6.1. සමුපකාර සංවිධාන අන්‍ය ව්‍යවසායන්ට වඩා වෙනස් වූ ව්‍යවසායන් ලෙස පිළිගැනීම.

6.1.1. සමුපකාර සංවිධාන යනු පෞද්ගලික අංශයට අයත් ලක්ෂණ ඇති අන්‍ය ව්‍යවසායන්ට වඩා වෙනස් වූ ව්‍යවසායන් ලෙස ශ්‍රී ලංකා ජනරජය පිළිගනී. ඒවා රාජ්‍ය ව්‍යවසාය සමඟ ක්‍රියාත්මක වෙමින් ශ්‍රී ලංකාවේ ජාතික ආර්ථිකයට හා සමාජ ආර්ථික සංවර්ධනයට වැදගත් කාර්ය භාරයක් ඉටු කරති.

6.1.2. ප්‍රාථමික සමුපකාරවලට මෙන්ම දිස්ත්‍රික්, පළාත් සහ ජාතික මට්ටමේ තමන්ට අදාල සංගම් සහ සමුපකාර ව්‍යාපාරයේ මුදුන් මට්ටමේ සංවිධාන නිදහස් ලෙස හා ස්වේච්ඡාමය පදනමින් ස්ථාපිත කිරීමටත් ඒවාට සම්බන්ධ වීමටත් සමුපකාර ව්‍යවස්ථාව අනුව මහජනතාවට ඇති අයිතිය රජය පිළිගනී.

### 6.2. සමුපකාර වල ස්වෛරියත්වය හා ස්වාධිනත්වය ශක්තිමත් කිරීම.

6.2.1. සමුපකාර සංවිධාන යනු රාජ්‍ය අංශයට බාහිර වූ ස්වෛරී හා ස්වාධීන ව්‍යාපාරික ආයතන ලෙස පිළිගනී. එසේ වුවද හඳුනාගත් ක්ෂේත්‍ර වල රාජ්‍ය අංශය සමඟ ව්‍යාපාරික සංධාන ස්ථාපිත කිරීමට අවකාශ තිබේ. එසේම සෙසු පෞද්ගලික අංශයේ ව්‍යවසායකයන් සමඟ ඕනෑම නීත්‍යානුකූල ක්ෂේත්‍රයක ව්‍යාපාර ස්ථාපිත කිරීම සඳහා සමුපකාර සංවිධාන වලට ඇති අයිතිය පිළිගනී.

6.2.2. සමුපකාර සංවිධාන ගැටළු සහගත තත්ත්වයන්ට පත් වූ විට සහ ප්‍රතිපත්තිමය කරුණු වලදී රජය විසින් සමුපකාර මෙහෙයවන්නෙකු, ව්‍යවස්ථාව අර්ථනිරූපණය කරන්නෙකු හෝ ගැටළු නිරාකරණය කරන්නෙකුගේ භූමිකාව ඉෂ්ඨ කරන අතර සමුපකාර සංවර්ධන කොමසාරිස් /සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් විසින් නියාමන කටයුතු

සහ පහසුකම් සැලැස්වීම පිලිබඳ කාර්යභාරය ඉටු කරනු ඇත. මේ සඳහා සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ ධාරිතාවය සහ ශක්තිමත්භාවය වැඩි දියුණු කිරීමට රජය විසින් කටයුතු කරනු ඇත.

6.2.3. සියළුම මට්ටම් වල සමුපකාර කටයුතු නියාමනය හා අධීක්ෂණය උදෙසා ප්‍රතිඵල පාදක කර ගත් ඇගයීම් ක්‍රියාවලියක් ස්ථාපිත කිරීමට රජය සහතික වනු ඇත.

6.2.4. සියළුම මට්ටම් වල සමුපකාර විගණනය පළාත් හෝ රේඛීය සමුපකාර සංවර්ධන කොමසාරිස්වරුන්ගේ කාර්ය මණ්ඩලය විසින් පිළිගත් විගණන මූලධර්ම මත ඉටු කෙරේ.

6.2.5. සමුපකාර ක්ෂේත්‍රයේ සාමාජිකයින්ගේ අයිතියට හානිකර හෝ අහිතකර හෝ එරෙහි ක්‍රියාමාර්ග වලදී සෑම මට්ටමකම සංවිධාන වල පාලක මණ්ඩල/ අධ්‍යක්ෂ මණ්ඩල වල සාමාජිකයින්ට දඬුවම් පැමිණවීම ඒවා ශක්තිමත් කිරීමට රුකුලක් බව පිලිගනී.

### 6.3. සමාන ලෙස සැලකීම.

අන්‍ය වූ ව්‍යවසායයන් හා සමාජ සංවිධානවලට සලකන ආකාරයට සමාන ලෙස සමුපකාර සංවිධාන වලටද රජය සලකනු ලැබේ. කෘෂිකර්මය, කුඩා හා මධ්‍ය පරිමාණයේ කර්මාන්ත, ධීවර කර්මාන්තය, අධ්‍යාපනය හා පුහුණුව, සෞඛ්‍ය, පාරිභෝගික සේවා හා ශ්‍රමිකයන්ගේ ස්වයං රැකියා වැනි පෞද්ගලික ව්‍යවසායයන්ට විවිධාංගිකරණය වීමට ඇති අවස්ථාවන්ට සමාන වන අයුරින් සමුපකාර සංවිධාන වලටත් ඉඩ කඩ සලසන අතර එම අවස්ථාවන් දිරිමත් කරවීමද සිදු වනු ඇත.

### 6.4. ජාතික ආර්ථිකයෙහි සමුපකාර දායකත්වය වර්ධනය කිරීම.

6.4.1. නිෂ්පාදන වැඩි කිරීම, අගය වැඩි කිරීමේ ක්‍රියා පද්ධතියට සහභාගී වීම, අපනයන වෙළඳාමෙහි නියුක්ත වීම, ග්‍රාමීය හා නාගරික ප්‍රදේශ වල ප්‍රධාන පාරිභෝගික භාණ්ඩ බෙදාහැරීම සහ මූල්‍ය කටයුතු වලට සහභාගී වීම ආදී ක්ෂෙත්‍රවල තම ස්වාධීනත්වයට හානි නොවන අයුරින් ජාතික ආර්ථික සංවර්ධනය සඳහා වූ තම දායකත්වය වැඩිදියුණු කිරීමට සමුපකාර සංවිධාන උනන්දු කරවනු ඇත.

6.4.2. විශේෂයෙන් කාන්තා සහ තරුණ සහභාගීත්වය වැඩිදියුණු කරන පරිදි හා සමාජ අන්තර්කරණය ප්‍රවර්ධනය වන පරිදි ආදායම් ජනනය කිරීම තුලින් දරිද්‍රතාවය අඩු කිරීමේ ජාතික සංවර්ධන සැලසුම් සකස් කිරීමේදී සමුපකාර සංවිධාන සක්‍රීයව සහභාගි වනු ඇත.

6.4.3. සෑම මට්ටමකම සමුපකාර සංවිධාන නවීකරණය හා විවිධාංගීකරණය සඳහාද, සමුපකාර සංවිධාන හා මහජන ව්‍යවසාය අතර හවුල් ව්‍යාපාර ස්ථාපිත කිරීම සඳහාද උනන්දු කරවන අතර, සහායද ලබා දෙනු ඇත.

6.4.4.අවිධිමත් ආර්ථිකය විධිමත් හා සුරක්ෂිත ආර්ථිකයක් බවට පෙරළීමේදී ද ශ්‍රී ලාංකීය සමාජ පරිවර්තනයේදීද ක්‍රියාකාරීවීමට ඇති ප්‍රමිතියද සමාජ සංරක්ෂණ ආවරණයට හා නියෝජනයට මෙන්ම සාධාරණය වෙනුවෙන් හඬ නැගීමට ඇති අයිතියද තහවුරු වන පරිදි සමුපකාර සංවිධාන වලට සහාය ලබා දෙනු ඇත.

6.4.5. පහසුකම් සැපයිය යුතු පසුගාමී මට්ටමේ පවතින ව්‍යාපාර ක්ෂේත්‍ර සංවර්ධනය කිරිමත්, නැගී එන ව්‍යාපාරික ක්ෂේත්‍රවල ව්‍යාපාර ආරම්භ කිරීම සඳහාත් සමුපකාර ව්‍යාපාර දිරිමත් කරනු ඇත.

6.4.6. සමුපකාර ක්ෂේත්‍රයේ නිර්මාණශීලීත්වය සහ නවෝත්පාදනය ගොඩ නැගීමට ගන්නා වූ වැයම දිරිමත් කෙරේ.

6.4.7. සියලුම මට්ටම් වල සමුපකාර සංවිධාන වල තැන්පතු භාර ගැනීම, ණය ලබාදීම ඇතුළු මූල්‍යමය ක්‍රියාකාරකම් වලට සහාය දීමද නියාමනය කිරීමද සිදුකෙරේ.

6.5. **සමුපකාර සංවිධාන සඳහා අධ්‍යාපනය, පුහුණුව හා ධාරිතා සංවර්ධනය**

6.5.1. සමුපකාර පුහුණු ක්‍රමය රජය හා පළාත් සභා යටතේ පවත්නා සමුපකාර පුහුණු ආයතන විශේෂඥතා සහිත පුහුණු හා ස්වේච්ඡා ආයතන බවට පරිවර්තනය කිරීම මගින් යාවත්කාලීන වූ හා ඉහළ මට්ටමකින් යුතු තත්ත්වයන්ට වැඩි දියුණු කරනු ඇත.

6.5.2. පළාත් සභා වල ස්ථාපිතව ඇති සමුපකාර පුහුණු මධ්‍යස්ථාන සමග අන්තර් සම්බන්ධතා තහවුරු කරනු ඇත.

6.5.3. සමුපකාර විෂය, රටෙහි අධ්‍යාපන ක්‍රමයේ සෑම මට්ටමකම සාමාන්‍ය අධ්‍යාපන විෂය මාලාවට ඇතුලත් කරනු ඇත.

6.6. **විමධ්‍යගතව ඇති සමුපකාර සංවිධාන සඳහා ගුණාත්මක වූ සහාය සේවා සැපයීම පිණිස පළාත් සභා සමඟ ඇති සහයෝගය වැඩි දියුණු කිරීම.**

6.6.1. සමුපකාර සංවිධාන අන්‍ය ව්‍යවසායයන්ට වඩා වෙනස් ව්‍යවසායයන් ලෙස පිළිගැනීමේ සංගතිය රජය හා පළාත් සභා අතර පවත්වා ගෙන යන අතර, එම ආයතන එකමුතුව ක්‍රියා කිරීම තුලින් අධ්‍යාපනය හා පුහුණුව, කළමනාකරණ උපදේශන සේවා, ගිණුම් හා පොත් තැබීම සහ ව්‍යාප්ති සේවා ප්‍රවර්ධනය සිදු කරනු ඇත. ප්‍රතිපත්තිය

නිවැරදිව හා පොදු ලෙස අර්ථ නිරූපණය කිරීමද ක්‍රියාත්මක කිරීමද සඳහා අවශ්‍ය සම්බන්ධීකරණ විධිවිධාන සලස්වනු ඇත.

6.6.2. රජය පලාත් සභා සඳහා පොදු නෛතික ආකෘතියක් හා නියාමන ක්‍රමවේදයක් හඳුන්වා දෙනු ඇත.

6.6.3. අන්තර් පළාත් සමුපකාර සංවිධාන හා ජාතික මහා සංගම් අතර පොදු අන්‍යෝන්‍ය අවබෝධයක් ගොඩනගා ගැනීම සඳහා අවස්ථා ඇති කර ගැනීම පිණිස රජය හා පළාත් සභාවල නියාමන බලධාරීන් අතර හවුල් යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කරනු ඇත.

6.6.4. පළාත්වල සමුපකාර සංවිධාන ජාතික මට්ටමේ මහා සංගම් සමඟ නිදහසේ ගනු දෙනු කිරීම සහ මුදුන් මට්ටමේ සමුපකාර සංවිධානයක් මගින් ප්‍රතිපත්ති සකස් කිරීම, ව්‍යවසාය සංවර්ධනය හා ජාත්‍යන්තර සම්බන්ධතා පවත්වා ගැනීම සඳහා කටයුතු කිරීමෙන් ජාතික ව්‍යාපාරයක් ලෙස ක්‍රියාත්මක කිරීම යන කරුණු, රජය හා පළාත් සභා යන ද්විත්ව ආයතනවල නියාමන බලධාරීන් විසින් තහවුරු කරනු ලබන අතර ඒ සඳහා අදාළ පාර්ශවයන් දිරිමත් කරනු ඇත.

6.7. **රජයේ සමුපකාර සේවා ව්‍යුහය ප්‍රතිසංවිධානය කිරීම.**

6.7.1. සමුපකාර ව්‍යාපාරය සඳහා වූ රාජ්‍ය සහාය ලබා දෙන ව්‍යුහය (සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව හා පළාත් සමුපකාර දෙපාර්තමේන්තු) වැඩි දියුණු කිරීම පිණිස අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ. සමුපකාර ව්‍යාපාර ප්‍රවර්ධනය හා නියාමනය සඳහා අවශ්‍ය වන තාක්ෂණික හා විශේෂඥ සේවා ගැන සලකා බලා රජය විසින් තෝරා ගනු ලැබූ කාර්ය මණ්ඩලයන්ට නව විශේෂඥතා පුහුණුව ලබා දී ඔවුන් ස්ථාන ගත කරනු ලැබේ. අවශ්‍ය භාණ්ඩ හා උපකරණ, තාක්ෂණ සහ සන්නිවේදන ක්‍රම සපයමින් සහාය සේවා පද්ධතිය වැඩි දියුණු කරනු ඇත.

6.7.2. සමුපකාර ව්‍යවසාය වල ස්වභාවය හා ඒ හා සම්බන්ධ ජාත්‍යන්තර භාවිතාවන් සැලකිල්ලට ගෙන සමුපකාර සංවිධාන වලට නව අභ්‍යන්තර විගණන ක්‍රමයක්, බාහිර විගණන ක්‍රමයක් හා සංවිධාන අධීක්ෂණ ක්‍රමයක් හඳුන්වා දෙනු ඇත.

6.7.3. සියලුම මට්ටම්වල සමුපකාර සංවිධාන ශ්‍රේණිගත කිරීම,ගුණත්ව සහතිකකරණය කාර්යසාධන තක්සේරු කිරීම,මිණුම්දඬු නිශ්චය කිරීම,හොඳම පරිචයන් භාවිතා කිරීම.

6.7.4. සමුපකාර සංවිධානවල මානව සම්පත සංවර්ධනය කිරීම උදෙසා ඒකාබද්ධ ප්‍රවේශයක් හඳුන්වා දීම,සමුපකාර වෘත්තීන් වෙනුවෙන් ආයතනයක් ස්ථාපිත කිරීම,අචාර ධර්ම හඳුන්වා දීම හා දැනුම් බෙදා හදා ගැනීම,නිර්මාණ සඳහා සුදුසු මාර්ගෝපදේශ හඳුන්වා දීමද, ක්‍රියාත්මක කිරීමද ධෛර්යමත් කෙරේ.

6.7.5. සංවිධානවල සම්පත් කළමනාකරණය විශිෂ්ටත්වයට පත් කිරීම.

**6.8. සෙසු අංශ සමඟ උපාය මාර්ගික හවුල් ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා සමුපකාර උනන්දු කිරීම.**

6.8.1. අගය වැඩි කිරීමේ ජාල සංවර්ධනය කිරීම, බලයලත් වෙළඳ මධ්‍යස්ථාන හා හවුල් ව්‍යාපාර ලෙස සකස් කිරීම සහ වෙළඳාම සඳහා ඇති කළ ව්‍යාපාර තුලින් අනෙකුත් ව්‍යාපාරික අංශ සමඟ උපාය මාර්ගික වෙළඳ හවුල් හා ඒකාබද්ධ ව්‍යාපාර සුදුසුතැන්හි ස්ථාපිත කිරීම සඳහා සමුපකාර දිරිමත් කරනු ඇත.

6.8.2. ගෝලීයකරණය වූ වෙළඳපලක අගය වැඩි කිරීමේ ක්‍රියාදාමයෙහි සාධාරණත්වය ද තරඟකාරිත්වයෙහි ලා නිෂ්පාදකයන් හා පාරිභෝගිකයන් මුහුණ දී ඇති ගැටළුද සලකා බලා නිෂ්පාදක - පාරිභෝගික සන්ධාන සවිමත් කිරීම සඳහාද භාණ්ඩ හා සේවා හුවමාරුව සඳහා ද රජය හා සමුපකාර ව්‍යාපාරය එකමුතුව කටයුතු කරනු ඇත.

6.8.3. විදේශ රටවල සමුපකාර ව්‍යාපාර සමඟ සම්බන්ධතා ඇති කර ගැනීම හා හවුල් ව්‍යාපාර ආරම්භ කිරීමට සමුපකාර සංවිධාන වලට රජය සහාය ලබා දෙන අතර ඊට අදාල හුවමාරු කරගැනීම්, සංධාන ගතවීම් හා සම්බන්ධතා ඇති කර ගැනීම සඳහා පහසුකම්ද සලස්වනු ලැබේ.

**6.9. සමුපකාර ව්‍යාපාරික කටයුතු විවිධාංගීකරණය කිරීම.**

ජාතික හා මට්ටම් වලදී සාමාජික අවශ්‍යතා පදනම් කරගත් ව්‍යාපාරික මෙහෙයුම් කටයුතු විවිධාංගිකරණය කිරීම පිණිස සමුපකාර සංවිධාන දිරිමත් කරනු ඇත. මෙම කටයුතු වලට, කෘෂිකාර්මික, කෘෂිකර්ම නිෂ්පාදන හා වෙළඳාම් කිරීම්, ආහාර සැකසුම් හා අගය වැඩි කළ ව්‍යවසායය,සාම්ප්‍රදායික කර්මාන්ත ,කෘෂිකාර්මික නොවන කර්මාන්ත, ඉදිකිරීම් හා දැනුම පදනම් කරගත් නිර්මාණ කේන්ද්‍ර, සමාජ හා සෞඛ්‍ය සේවා, සමාජ උත්සව, බැංකු සේවා,සමාජ ආරක්ෂණ ආනයන හා අපනයන වෙළඳාම, ප්‍රවාහනය හා සංචාරක සේවා,වාහන හා අමතර කොටස් ,බැංකු හා රක්ෂණ, තොරතුරු තාක්ෂණය හා සන්නිවේදන පහසුකම් යන අංශද, පරිසර සංරක්ෂණය හා ආපදා කළමනාකරණය, වැඩිහිටි හා ආබාධිතයන් සඳහා වූ සේවා, වෙළඳ ප්‍රචාරණය, කර්මාන්ත හා සේවා අංශ, වැඩිහිටියන් සඳහා වූ සේවා අංශද, ඉදිකිරීම් හා ප්‍රාථමික මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා අතරමැදියන් ලබා දෙන අන් හැම ආකාරයකම සේවාවන්ද අයත් වේ.

**6.10. සමුපකාර වශයෙන් සංවිධානය වීම සඳහා වරප්‍රසාද නොලත් ජන කණ්ඩායම් වලට සහාය වීම.**

දිළිඳු ජන සමූහ, කාන්තා ගෘහ මූලික පවුල්, ආදිවාසි ජනයා හා ඌණ සංවර්ධිත ප්‍රදේශ වල වෙසෙන ජනයා වැනි වරප්‍රසාද නොලැබූ, කොන් වූ හා හිංසාවට පහසුවෙන් ගොදුරු විය හැකි ජනයා, ප්‍රධාන සමාජ ප්‍රවාහයට රැගෙන ඒම පිණිස සමුපකාර සංවිධාන ලෙස බලගැන්වීමට උනන්දු කරවා එකමුතු කිරීම සඳහා තාක්ෂණික හා මූල්‍ය සහාය ලබා දෙනු ඇත. යෝග්‍ය පරිදි මූල්‍යාධාර ලබා දීම දීර්ඝ කාලීන හා පොලී රහිත ණය මුදල්, බදු සහන හා මහජන වැඩ සටහන් මෙම සහායට අයත්ය. මෙමඟින් එම ප්‍රජාව හා ජන කොටස් වල සමුපකාර සංවිධාන තිරසාර භාවයෙන් යුතු සමාජ ආර්ථික ව්‍යවසායයන් බවට පත් වෙතැයි අපේක්ෂා කෙරේ.

**6.11. සමුපකාර පාලන ක්‍රම ශක්තිමත් කිරීම.**

6.11.1. සමුපකාර යනු පුද්ගල සමූහයක් විසින් ස්ථාපිත කරගත් සංවිධානයක් මෙන්ම ව්‍යවසායයක් බව විශ්වාස කරන රජය විසින් සමුපකාර පාලන ක්‍රමයෙහි සුවිශේෂත්වය සලකා බලමින් අවශ්‍ය නියාමන යාන්ත්‍රණය හා අනුකුලතා විධිවිධාන හඳුන්වා දෙනු ඇත.

6.11.2. වෘත්තීයමය විශේෂඥතාවයෙන් යුතු සමුපකාර සාරධර්ම පදනම් කරගත් කළමනාකරණ ක්‍රමයක් හඳුන්වා දීමේ පරමාර්ථයෙන් රජය විසින් සංස්ථාමය යහ භාවිතාවන්, අධ්‍යක්ෂවරුන් හා සේවකයන් සඳහා වූ චර්යා ධර්ම පද්ධති, අධ්‍යක්ෂ මණ්ඩල හා කළමණාකරුවන් අතර සම්බන්ධතා, අවදානම් කළමනාකරණය,

මානව සම්පත් සංවර්ධනය, ආයෝජන හා ණය පිළිබඳ ප්‍රතිපත්ති හා යහපාලනයට අවශ්‍ය වන අනෙකුත් ප්‍රතිපත්ති සකස් කර ගැනීම පිණිස සමුපකාර සංවිධාන වලට සහාය ලබා දෙනු ඇත.

6.11.3. අධ්‍යාපන හා පුහුණු ක්‍රියාකාරකම් සකස් කිරීම, සාමාජිකයන්ට පාලනයට සහභාගී වීම පිණිස ආකර්ශනයක් ඇතිව මහා සභා රැස්වීම් සංවිධානය කිරීම, කාරක සභා හා කාර්ය බලකාය සමඟ අධ්‍යක්ෂ මණ්ඩල තෝරා ගැනීම් ආදියට ඉඩකඩ සැලසීම මඟින් පාලනයෙහි ලා සාමාජික සහභාගීත්වය වැඩි කර ගැනීමට සමුපකාර සමිති ක්‍රියාත්මක වනු ඇත.

6.11.4. සාමාජික සහභාගීත්වයට අතිරේකව සමුපකාර සමිතිද සියලු මට්ටම් වලදී සමුපකාර සංවිධානවල සහභාගීත්වය වැඩි දියුණු කරනු ඇත. එයට අමතරව සෙසු අවදානම් දරන්නන්ගේ සහභාගීත්වයද පුළුල් කරනු ඇත.

6.11.5. සමුපකාර යහපාලනය සඳහා රජය විසින් සාංගමික යහ භාවිතා සංග්‍රහයන් ආචාර ධර්ම පද්ධති,තීරණ ගැනීමේදී මාර්ගෝපදේශ,තොරතුරු සන්නිවේදන පරිචයන් හඳුන්වා දීමේ මූලිකත්වය ගනු ඇත.

6.11.6. නිලවරණ නිදහස් හා සාධාරණ බවට පත් කිරීමේ චේතනාවෙන් ප්‍රජාතන්ත්‍රවාදී සාමාජික පාලනය පිළිබඳ ප්‍රතිපත්තිය අනුව යමින් අධ්‍යක්ෂ මණ්ඩලවලට හා සෙසු තනතුරු වලට පත් කර ගැනීම සඳහා පවත්වන ඡන්ද විමසීම් වලදී එක් අයෙකුට එක් ඡන්දයක් යන පදනමින් ඡන්දය ප්‍රකාශ කිරීමේ සම අයිතිය රකිමින් පිළිගත් ඡන්ද විමසීම් නියමයන් අනුගමනය කිරීමට රජය විසින් සමුපකාර සමිති උනන්දු කරවනු ඇත.

6.11.7. අධ්‍යක්ෂ මණ්ඩල සමාජිකයන් විසින් සිදුකරන වැරදි හෝ අත්වැරදීම් සම්බන්ධයෙන් පරිපාලනමය වශයෙන් දඬ හෝ දඩුවම් නියම කිරීමට ක්‍රියා කරනු ඇත.

## 6.12. සමුපකාර මූල්‍ය සම්පාදනය

6.12.1. සමුපකාර සංවිධාන යනු සාමාජිකයන් විසින් පාලනය කරන සෙවරී වූ ආත්මාධාර සංස්ථා ලෙස පිළිගන්නා රජය හා සමුපකාර සංවිධාන විසින් ඒවායේ ස්වයං ප්‍රාග්ධන සම්පාදනය සඳහා මූල්‍ය සම්පත් වර්ධනය සහතික කරන කොටස් ප්‍රමාණය හා අගය වැඩි කිරීම, අතිරේක හා පරිපූරක කොටස් එකතුව, ආරක්ෂක අරමුදලක් ඇති කිරීම, තැන්පත් ලබා ගැනීම,ණය ලබා දීම, ලාභ එක් කිරීම හා ව්‍යාපාර කටයුතු වැඩි කිරීම හා විවිධාංගිකරණය කිරීම වැනි උපාය මාර්ග හඳුනාගෙන ක්‍රියාත්මක කිරීම උපරිම ලෙස යොදා ගනු ඇත.

6.12.2. රාජ්‍ය සේවා පවත්වාගෙන යාම පිණිස සමුපකාර සංවිධාන ලබා දෙන සහායට අනුග්‍රහ දැක්වීමක් වශයෙන් සමුපකාර වල බදු හා වෙනත් සහන දීම පිළිබඳව රජය වරින් වර සලකා බලනු ඇත.

6.12.3. මධ්‍යකාලීන සැලැස්මක් ලෙස සමුපකාර සමිති මඟින් බැංකුවක් ස්ථාපනය කිරීම හා ක්‍රියාත්මක කිරීම පිණිස රජය විසින් අවශ්‍ය නෛතික ආකෘතියක් සකස් කරනු ඇත.

6.12.4. සමුපකාර සංවර්ධන අරමුදල සමුපකාර සංවිධාන වලට අයිති අරමුදලක් ලෙස සලකන අතර, එය අදාල සියලුම කොටස් වල අවදානම දරන්නන්ගේ සහභාගිත්වය ඇති පාලනයක් සහිතව හුදෙක් සමුපකාර සංවර්ධනය සඳහාම යොදාගත යුතුය.

6.12.5. එම අරමුදල කිසියම් පුද්ගලයෙකු විසින් හෝ ආයතනයක් විසින් හෝ අයථා පරිහරණයට ඉඩකඩ නොලැබෙන පරිදි මෙහෙයුම් යාන්ත්‍රණයක් පිහිටුවනු ඇත. ඒ සඳහා වන මාර්ගෝපදේශ සංග්‍රහයක් සකස් කෙරේ.

## 6.13. සමුපකාර සංවිධානවල සේවා තත්ත්වයන් වැඩි දියුණු කිරීම හා වෘත්තීයමය අවස්ථා වැඩි කිරීම.

6.13.1. සමුපකාර සේවක කොමිෂන් සභාව සමුපකාර සේවකයන්ට හා සමුපකාර සමිති වලට වගවීමකින් යුතුව කටයුතු කිරීම පිණිස සමුපකාර ව්‍යාපාරය සමඟ හවුල් වී ක්‍රියා කර නව මානව සම්පත් සංවර්ධන ව්‍යුහයක් ස්ථාපිත කරනු ඇත. මෙම ව්‍යුහය මඟින් සමුපකාර සංවිධාන වල මානව සම්පත් පදනම හා සමුපකාර සේවකයින්ගේ සේවා තත්වයන් වැඩි දියුණු කිරීම පිණිස නව කාර්ය භාරයක් ඉටු කරනු ඇත. එසේම මෙම ක්‍රමය මගින් සමුපකාර සේවකයින් සඳහා පොදු විනය සංග්‍රහයක්ද,චර්යා ධර්ම පද්ධතියක්ද සකස් කරනු ඇත.

6.13.2. ජාත්‍යන්තරව පිළිගත් කම්කරු ප්‍රඥප්තීන්ට අනුකූල වන පරිදි සමුපකාර සේවක කොමිෂන් සභා විසින් නියාමන ක්‍රමවේදයක් ක්‍රියාත්මක කරනු ඇත.

6.13.3. තමන්ගේ සේවක මණ්ඩල සඳහා ස්වයං වෘත්තීය වර්ධන ව්‍යුහයක් සකස් කරගෙන ඉහත සඳහන් කරන ලද සමුපකාර අංශයේ පුළුල් මානව සම්පත් ව්‍යුහයට සම්බන්ධ කොට තම අභිලාශයන් මුදුන්පත් කරගැනීමට රජය විසින් සමුපකාර සංවිධාන වලට සහාය දෙනු ඇත.

6.13.4. ජාතික සමුපකාර සංවර්ධන ආයතනය ප්‍රතිව්‍යුහගත කෙරෙන අතර එමගින් නව මානව සම්පත් සංවර්ධන ක්‍රමයක් යටතේ සමුපකාර සමිති අධ්‍යක්ෂ මණ්ඩල හා සේවකයින් නැවත පුහුණු කිරීම සඳහාත් නිත්‍ය සමුපකාර කළමනාකරණ පුහුණු වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම සඳහාත් අවශ්‍ය කටයුතු කරනු ඇත.

6.13.5. අවශ්‍යතාවය පරිදි සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම හඳුන්වා දීම සඳහා රජයේ මග පෙන්වීම සහතික කරනු ඇත.

6.13.6. සමුපකාරකයින්ගේ වෘත්තීය නිපුනත්වය ඉහල දැමීම සඳහා සමුපකාර වෘත්තීයවේදීන්ගේ ආයතනයක් ස්ථාපිත කිරීමට ක්‍රියා කිරීම.

6.13.7. සියලුම මට්ටම්වල සමුපකාර සංවිධාන සඳහා ඒකාබද්ධ සමුපකාර සේවා සමූහයක් ස්ථාපිත කිරීමේ ඉඩකඩ සොයා බැලේ.

6.13.8. සියලුම සමුපකාර සංවිධානවල සියලුම කාණ්ඩවල සේවකයන් සඳහා අවශ්‍ය වෘත්තීය සංවර්ධන වැඩපිලිවෙලක් ජාතික සමුපකාර සංවර්ධන ආයතනය මඟින් ක්‍රියාවට නැංවේ.

## 6.14. ධරණීය සංවර්ධනය

6.14.1. ජාත්‍යන්තර වශයෙන් පිළිගත් හා රජය විසින් ආදේශනය කර ගත් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ධරණීය සංවර්ධන ඉලක්ක සමුපකාර සංවිධාන විසින් සුදුසුතැන්හි ආදේශනය කර ක්‍රියා කරනු ඇත.

6.14.2 ධරනිය සංවර්ධනය සඳහා සමුපකාර ක්ෂේත්‍රය තුල පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම් දිරිමත් කෙරේ.

6.14.3 විනාශකාරී තත්වයන් කළමනාකරණය කිරීම, දේශගුණික විපර්යාසයන්ට එරෙහිව සටන් කිරීම සහ පරිසරය ආරක්ෂා කිරීම සඳහා සමුපකාර ව්‍යාපාරය රජය සමඟ සහයෝගීතාවයෙන් කටයුතු කිරීමට අපේක්ෂා කෙරේ.

6.14.4 සමුපකාර ව්‍යවසායන් ඔවුන්ගේ සාමාජිකයින්ට පරිසර හිතකාමී නිෂ්පාදන හා සැකසුම් ක්‍රමවේදයන් අනුගමනය කිරීමට දිරිගන්වන අතර සුදුසු අවස්ථාවලදී පුනර්ජනනීය ක්‍රියාවලීන්හි නිරත වන අතර පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් භාවිතා කරයි.

### 6.15. සාමය හා සමාජ සුසංගමය ප්‍රවර්ධනය කිරීම .

6.15.1. ප්‍රජාතන්ත්‍රවාදය, සමානාත්මතාවය, සමතාවයන සාරධර්ම සහ සමාජ වගකීම හා අන්‍යයන් ගැන තැකීම යන ආචාර ධර්ම අනුගමනය කරමින් සමුපකාර සංවිධානයන්, ඒවාහි ව්‍යුහය මගින් විවිධ අංශ වල සංයුතියෙදී හා සාමාජිකත්වය පිරිනැමීමේදී කිසිදු වෙනසකින් තොරව බිම් මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා විවිධ ජන වර්ග සමූහ, ප්‍රජා සමූහ හා ආගමික කණ්ඩායම් තම කටයුතු සඳහා යොදා ගනිමින් හා මනා අවබෝධයකින් යුතුව විනාශකාරී බලවේග පාලනය කරමින් සියලුදෙනා අන්තර්ග්‍රහණය කරගැනීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කරනු ඇත.

6.15.2. සෑම මට්ටමකම විවිධ සංස්කෘතික, ජනවාර්ගික හා ආගමික කණ්ඩායම් සහභාගී වන සාමූහික ප්‍රවේශ ක්‍රම මගින් ප්‍රජා සංවර්ධන වැඩ සටහන් හා සාමය ගොඩ නැගෙන කටයුතු වලදී සමුපකාර සංවිධානය මූලිකත්වය ගෙන ක්‍රියා කරනු ඇත.

6.15.3. සමුපකාරකයින් අතර ඒකාග්‍රතාවය හා සාමූහිකත්වය හා වර්ධනය කිරීමේ අරමුණින් සමුපකාර සංවිධාන අතර විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම දිරිමත් කෙරේ.

### 6.16. සමුපකාර ව්‍යවසායයන් සඳහා තොරතුරු හා සංඛ්‍යා ලේඛන දත්ත සංහිතාවක් ස්ථාපිත කිරීම.

6.16.1. සමුපකාර පිලිබඳ නිවැරදි තොරතුරු පැවතීමේ අවශ්‍යතාවය හඳුනාගෙන ඇති අතර සමුපකාර හා ඒවායේ ක්‍රියාකාරිත්වය පිලිබඳ ක්‍රමානුකුල තොරතුරු එක් රැස් කරගෙන එම තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා ක්‍රමයක් සමුපකාර ව්‍යාපාරය හා රජයේ හවුල් ප්‍රයත්නයක් ලෙස ස්ථාපිත වනු ඇත.

6.16.2. විවිධ වර්ගවල සමුපකාරවලින් දත්ත, සංඛ්‍යා ලේඛන හා තොරතුරු එක් රැස් කරගෙන ඒවා තක්සේරු කරන අතර ඒවා සංවර්ධන සැලසුම් හා වැඩ සටහන් සකස් කිරීමට යොදා ගන්නා සමුපකාර ව්‍යවසාය සඳහා හොඳින් ක්‍රියා කරන දත්ත මූලයක් සකස් කරනු ඇත.

6.16.3. දත්ත පාදය නිරන්තරයෙන් යාවත්කාලීන කරමින් වෙබ් අඩවි හා අනෙක් මාධ්‍ය මඟින් දත්ත හා තොරතුරු ප්‍රාදේශිය, ජාතික හා ජාත්‍යන්තරව බෙදා හදා ගැනීමට ක්‍රියා කෙරේ.

### 6.17. සමුපකාර මගින් ආදායම් හා රැකියා ජනිත කිරීම.

6.17.1. සියළුම වර්ගයේ සමුපකාර වල පූර්ණ හැකියාව අභිවර්ධනය කිරීම තුළින් සමුපකාර සාමාජිකයන්ගේ ආදායම් හා රැකියා උපදවන ක්‍රියාකාරකම් බිහි කිරීමට,සමාජ ආරක්ෂණ තහවුරු කිරීමට ආරක්ෂාව හා සනීපාරක්ෂාව වැඩි දියුණු කිරීමට, විශේෂයෙන් කාන්තාවන්ට හා තරුණයන්ට තිරසාර වුත් යහපත් වූත් ස්ත්‍රී පුරුෂ සමානතාවය සවිමත් කරන්නාවූත් පියවරයන් දිරිගැන්වෙනු ඇත.

6.17.2. තිරසාර පරිභෝජන හා නිෂ්පාදන ක්‍රියාවලියක නිරතවන අතරතුර සමුපකාර අංශයේ සේවකයින් සඳහා සමාජ සුරක්ෂිතතාවය සහ යහපත් රැකියාවක් සහතික කිරීම සඳහා කළමනාකරණ මණ්ඩලය / අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පියවර ගනු ලැබේ.

## 6.18. සමුපකාර නීතිය යාවත්කාලීන කිරීම.

6.18.1. වඩාත් යාවත්කාලීන වූද සමුපකාරවලට හිතකර වූද නීතියක අවශ්‍යතාවය රජය විසින් අවබෝධ කරගෙන තිබේ. එම නිසා ජාත්‍යන්තර වශයෙන් පිළිගත් නෛතික ප්‍රතිපාදනයන් පදනම් කරගෙන සමුපකාර ව්‍යාපාරය හා පළාත් සභා සමග කරන කතිකා මාර්ගයෙන් සාමාජික අයිතිය හා කළමනාකරණයෙන් යුතු ව්‍යවසායන් බවට සමුපකාර සංවිධාන පත් කිරීම සඳහා පවතින සමුපකාර නීතිය යාවත්කාලීන කිරීම සඳහා රජය විසින් කටයුතු කරනු ඇත.

6.18.2. සමුපකාර සඳහා නීති,රීති නියෝග හා මාර්ගෝපදේශ සකස් කිරීමේදී හා ප්‍රතිශෝධනය කිරීමේදි අනෙකුත් ජාතික ප්‍රතිපත්ති සලකා බලන අතර රජය ප්‍රතිපත්තියක් වශයෙන් සමුපකාර සංවිධාන හා අනෙකුත් අවදානම දරන ආයතන සමඟ සාකච්ඡා කරනු ඇත.

6.18.3. ජාතික රජය හා පළාත් සභා සමුපකාර නීතියේ ඒකමිතියක් ඇති කිරීම පිණිස ආදර්ශ නීති සංග්‍රහයක් සකස් කරනු ඇත. එමෙන්ම ජාතික රජයේ ආයතන සහ පළාත් සභා ආයතන අතර වන ක්‍රියාකාරීත්වය විධිමත් කිරීම සඳහා සම්මත මෙහෙයුම් පටිපාටියක් (SOP) සකස් කෙරේ.

6.18.4. මීට අතිරේකව සමුපකාර සඳහා වූ කම්කරු නීතිය සංශෝධනය කිරීමේදී ජාත්‍යන්තර කම්කරු සංවිධානය විසින් ප්‍රකාශයට පත් කර ඇති වැඩ කිරීම පිළිබඳ මූලධර්ම හා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය අනුව රජය කටයුතු කරනු ඇත.

6.18.5. සමුපකාර නීතියේ පොදු ආකෘතිය අනුව සමුපකාර සංවිධාන වලට තමන්ගේ අතුරු ව්‍යවස්ථාවන් පොදු ආකෘතියේ අන්තර්ගතයට අනුකූල නොවන ආකාරයට තමන්ම සකස් කර සම්මත කර ගැනීම සඳහා අවශ්‍ය වන්නා වූ සහාය ලබා දෙනු ඇත.

6.18.6. සංශෝධිත සමුපකාර නීතිය කැප වීමෙන් යුතුව ක්‍රියාත්මක කිරීමට රජය සහතික වේ.

6.18.7. සමුපකාර මුල්‍ය සේවාවන් විධිමත් රාමුවකට ගෙන එම සඳහා සමුපකාර මුල්‍ය පනතක් කෙටුම්පතක් කර අනුමත කර ගැනීමට ක්‍රියා කරනු ඇත.

## 6.19. සමුපකාර සංවිධාන සඳහා නව තොරතුරු තාක්ෂණය හඳුන්වා දීම.

නවීන ව්‍යාපාරික ලෝකයට ගැලපෙන පරිදි හා තරඟකාරී ලෝකයේ තරඟකරුවන් සමග තරඟ කිරීමට හැකිවන පරිදි සමුපකාර ව්‍යාපාර ක්‍රියාකාරකම් ඉහළ නැංවීම සඳහා තොරතුරු තාක්ෂණය හඳුන්වාදීමට හා උපරිමයෙන් භාවිතයට ගැනීම දිරිමත් කිරීමට රජය විසින් කටයුතු කරනු ඇත.

## 7. ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ගය

ජාතික රජය විසින් රජයේ හා පළාත් සභාවල අදාල අමාත්‍යාංශ නියෝජිතයන්, රේඛීය හා පළාත් සභා සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තු, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය,රේඛීය හා පළාත් සභා සමුපකාර සේවක කොමිෂන් සභා හා ජාතික සමුපකාර මණ්ඩලයේ නියෝජිතයින් ඇතුලත් ඒකාබද්ධ ක්‍රියාත්මක කිරීමේ හා මෙහෙයවීමේ කමිටුවක් ස්ථාපනය කරනු ඇත. ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ වගකීම රජයේ සමුපකාර විෂය භාර අමාත්‍යාංශයට පැවරේ. ක්‍රියාත්මක කිරීමේ හා මෙහෙයවීමේ කමිටුව විසින් ක්‍රියාකාරී උපාය මාර්ගයන් සකස් කරන

අතර පහත දැක්වෙන ප්‍රමුඛතා ක්ෂේත්‍ර සැලකිල්ලට ගනිමින් ක්‍රියාත්මක සැලැස්මක් සකස් කරනු ඇත.

(අ) ජාතික සමුපකාර ප්‍රතිපත්තිය ප්‍රචලිත කිරීම.

(ආ)අවදානම දරන සියලුම අංශ නියෝජනය වන කමිටුවක සහාය ඇතිව නව සමුපකාර නීතියක් සකස් කිරීම.

(ඇ) රජයේ හා පළාත් සභා වල විෂය භාර අමාත්‍යාංශයේ සේවා යටිතල ව්‍යුහය පූර්ණ ලෙස ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම.

(ඈ) සමුපකාර සංවිධාන සඳහා නව මානව සම්පත් සංවර්ධන ක්‍රමයක් නිර්මාණය කිරීම පිණිස රජයේ හා සමුපකාර සංවිධාන වල නායකයින් නැවත පුහුණු කිරීමට කඩිනම් පියවර ගැනීම.

ඉදිරි දශක දෙක ඇතුලත කෙටි කාලීන, මධ්‍ය කාලීන හා දීර්ඝ කාලීන උපාය මාර්ග සැලසුම් සකස් කර සමුපකාර ක්ෂේත්‍රයට අදාළ සියලුම ආයතනවල පූර්ණ දායකත්වයෙන් සහ ක්‍රියාකාරී සහභාගීත්වයෙන් ක්‍රියාත්මක කිරීම තුලින් මෙම ප්‍රතිපත්තියේ අරමුණු ළඟා කිරීම සඳහා රජය ඇප කැප වෙනු ඇත.